රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2025-06-09 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ස්වකීය අනන්‍යතාව සහිත වෙන් වූ රාජ්‍ය ව්‍යවසායන් ලෙස පවත්වාගෙන යාම**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඒකාබද්ධ කරමින් එක් රාජ්‍ය සමාගමක් පිහිටුවීම සඳහා 2023-11-27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එවකට පැවති රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය විසින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඒකාබද්ධ කර සමාගම් පනත යටතේ රාජ්‍ය සමාගමක් පිහිටුවීම සිදු කළ යුතු ආකාරය පිළිබඳව සිය නිර්දේශ ඉදිරිපත් කර තිබේ. එහෙත්, ඒ සම්බන්ධයෙන් මෙතෙක් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැත. කෙසේ වුව ද, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව එකිනෙකට වෙනස් තාක්ෂණයන් භාවිතා කිරීම, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ පටිගත කිරීමේ මැදිරිවලට වඩා වැඩි ඉඩ ප්‍රමාණයක් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ පටිගත කිරීමේ මැදිරිවලට අවශ්‍ය වීම, ඒවායේ සම්ප්‍රේෂණ කුලුනු විවිධ ස්ථානවල පැවතීම හේතුවෙන් ඒකාබද්ධ කිරීම අපහසු වීම ආදී හේතූන් මත එකී ආයතන ඒකාබද්ධ කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි බව මේ වන විට හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව තවදුරටත් ස්වකීය අනන්‍යතාව සහිත වෙන්වූ රාජ්‍ය ව්‍යවසායන් ලෙස විධිමත් උපායමාර්ගික ව්‍යාපාරික සැලැස්මක් ඔස්සේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ආදායම් තත්ත්වය ඉහළ නංවා ගනිමින් පවත්වාගෙන යාම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. ලෝක වෙළෙඳ සංවිධානයේ ධීවර සහනාධාර පිළිබඳ ගිවිසුමේ අදියර I අපරානුමත කිරීම**

2017 වසරේදී ආර්ජන්ටිනාවේ බුවනෝස් අයර්ස්හි පවත්වන ලද ලෝක වෙළෙඳ සංවිධානයේ 11 වැනි අමාත්‍ය සම්මේලනයේදී ධීවර සහනාධාර නියාමනය කිරීම පිළිබඳව ගෝලීය ගිවිසුමක අවශ්‍යතාව තහවුරු කර ඇත. ඒ අනුව, ලෝක වෙළෙඳ සංවිධානය 2022 වර්ෂයේ පැවති 12 වන අමාත්‍ය සම්මේලනයේදී ලෝක වෙළෙඳ සංවිධානයේ ධීවර සහනාධාර පිළිබඳ ගිවිසුම සම්බන්ධයෙන් වන කටයුතු අවසන් කර තිබේ. එකී ගිවිසුම මඟින් නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

කටයුතුවලට දායක වන සහනාධාර තහනම් කිරීම, අධිඅස්වනු කරනු ලැබූ මත්ස්‍ය තොග සඳහා සහනාධාර තහනම් කිරීම සහ අධිධාරිතාව හා අධික ලෙස මසුන් ඇල්ලීම සඳහා දායක වන සහනාධාර තහනම් කිරීම යන ප්‍රධාන කුලුනු තුන (03) ආවරණය වේ. ඉහත සඳහන් පළමු කුලුනු දෙක (02) ඇතුළත්ව සකස් කරනු ලැබ ඇති ධීවර සහනාධාර පිළිබඳ ගිවිසුමේ අදියර I අපරානුමත කිරීම 2023 වර්ෂයේ සිට ලෝක වෙළෙඳ සංවිධානයේ සාමාජික රටවල් විසින් ආරම්භ කර ඇත. සාගර තිරසරභාවයෙහි ශ්‍රී ලංකා නායකත්වය ශක්තිමත් කිරීමට, ප්‍රධාන වෙළෙඳපොළවල ශ්‍රී ලංකාවේ වෙළෙඳ තත්ත්වය ශක්තිමත් කිරීමට, ශ්‍රී ලංකාවේ ධීවර අංශය නවීකරණයට අත්‍යවශ්‍ය ධාරිතාව ගොඩනැංවීමට සහ තාක්ෂණික සහාය සපයා ගනිමින් ලෝක වෙළෙඳ සංවිධානයේ විශේෂිත ධීවර අරමුදලින් ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන පරිදි ධීවර සහනාධාර පිළිබඳ ගිවිසුමේ අදියර I අපරානුමත කිරීම පිණිස ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලීසිය හා ශ්‍රී ලංකා පොලීසිය අතර අන්තර්ජාතික අපරාධවලට එරෙහිව ක්‍රියා කිරීම/පිටු දැකීම සහ පොලිස් සහයෝගිතාවය පිළිබඳව අවබෝධතා ගිවිසුමට එළඹීම**

ත්‍රස්තවාදය, සයිබර් අපරාධ, මත්ද්‍රව්‍ය ජාවාරම, මිනිස් වෙළෙඳාම, මිනිස් ජාවාරම සහ වෙනත් ආකාරයේ සංවිධානාත්මක හා ජාත්‍යන්තර අපරාධ හේතුවෙන් වර්ධනය වන අභියෝගයන්ට මුහුණ දීමේදී ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව සමාන අභිලාෂයන් සහිතව කටයුතු කරනු ලබයි. එබැවින්, ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ වැළැක්වීම, විමර්ශනය කිරීම හා නීති ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගිතා පහසුකම් සැපයීම, සම්බන්ධීකරණ නීති පැනවීමේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, පවත්නා සහයෝගිතා රාමු ශක්තිමත් කිරීම, තොරතුරු ප්‍රවර්ධනය සහ දැනුම හුවමාරු කිරීම, ධාරිතා සංවර්ධනය ආදිය අරමුණු කර ගනිමින් ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලීසිය සහ ශ්‍රී ලංකා පොලීසිය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට යෝජනා වී ඇත. ඒ අනුව, දෙපාර්ශ්වය අතර අන්තර්ජාතික අපරාධ මැඩලීම සහ පොලිස් සහයෝගිතාව පිළිබඳව වන අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීම

2023 අයවැය යෝජනාවකට අනුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කර ඇත. ඒ අනුව, එම වර්ෂයේදී වෙන් කරන ලද රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන යොදවා, විශ්වවිද්‍යාලය තුළ ඇති ගොඩනැගිලි භාවිත කරමින් හා නවීකරණය කර ගනිමින් මේ වන විට සිසුන් 80දෙනෙකු බඳවාගෙන ඇති අතර, පළමු සහ දෙවන අධ්‍යයන වර්ෂයන් ක්‍රියාත්මක වෙමින් පවතී. නමුත්, අවශ්‍ය දේශන ශාලා, පරිපාලන ගොඩනැගිලි සහ පූර්ව සායනික ගොඩනැගිලි මෙතෙක් ඉදිකර නොමැති වීම හේතුවෙන් එම වෛද්‍ය පීඨයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට බාධා පැමිණ ඇත. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල භූමිය තුළ දේශන ශාලා ද ඇතුළුව පූර්ව සායනික ගොඩනැගිල්ල සහ අත්‍යවශ්‍ය පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම පිණිස අවශ්‍ය පිරිවැය රුපියල් මිලියන 2,149ක් වශයෙන් ගණනය කර තිබේ. ඒ අනුව, මෙම වසර තුළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර, අවශ්‍ය ප්‍රතිපාදන 2026-2028 අයවැය කාලරාමුව තුළ වෙන් කර ගැනීම මඟින් අදාළ පහසුකම් සලසා ගැනීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. මධ්‍යම අධිවේගී මාර්ග - අදියර IV (කුරුණෑගල සිට දඹුල්ල දක්වා මාර්ගය) ඉදිකිරීම

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර IV (කුරුණෑගල - දඹුල්ල) සඳහා අත්කර ගත්, වන්දි මුදල් කොටසක් ගෙවා ඇති ඉඩම් කැබලි සඳහා ඉතිරි වන්දි මුදල් ගෙවීමටත්, වන්දි මුදල් නොගෙවූ ඉඩම් කැබලි ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රකාරව අවසතු කිරීමටත් 2023-03-20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර IV ව්‍යාපෘතියේ ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලියේ භෞතික ප්‍රගතිය 73.2%කි. විශේෂයෙන් උතුරු, උතුරු මැද, නැගෙනහිර හා මධ්‍යම පළාත් වෙත ප්‍රවේශ වීමට ප්‍රමාණාත්මක සහ ගුණාත්මක මාර්ග පද්ධතියක අවශ්‍යතාව සපුරා ගැනීමටත්, සමස්ත මධ්‍යම අධිවේගී මාර්ගයේ අපේක්ෂිත පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීමටත් මධ්‍යම අධිවේගී මාර්ගය අදියර IV සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය බව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, මධ්‍යම අධිවේගී මාර්ගයේ අදියර IV ව්‍යාපෘතියේ කුරුණෑගල සිට දඹුල්ල දක්වා වූ කොටසට අදාළ ඉදිරි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් දැනට අත්හිටුවා ඇති ඉඩම් අත්කර ගැනීමේ කටයුතු නැවත ආරම්භ කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සඳහා ප්‍රධාන සැලැස්ම පිළියෙල කිරීම**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සඳහා වන ප්‍රධාන සැලැස්ම සකස් කිරීම පිණිස උපදේශක ආයතනයක් තෝරා ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුව යෝජනා කැඳවා ඇත. එම යෝජනා ඇගයීමෙන් අනතුරුව, එකී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ සමාගම විසින් කොන්දේසි ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත අදාළ කොන්ත්‍රාත්තුව අවලංගු කර, ප්‍රසම්පාදන කාර්යය නැවත ආරම්භ කිරීමට සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් කටයුතු කර ඇත. අලුතින් කැඳවන ලද ප්‍රසම්පාදනය සඳහා නෙදර්ලන්තයේ එයාර්පෝට් කන්සල්ටන්ස් වශයෙන් සිය මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන M/s Haskoning DHV Netherland B.V. විසින් පමණක් තනි යෝජනාවක් ඉදිරිපත් කර තිබේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශක ප්‍රසම්පාදන කමිටුව විසින් එකී යෝජනාව ඇගයීමෙන් අනතුරුව අදාළ උපදේශක කොන්ත්‍රාත්තුව එම ආයතනය වෙත පිරිනැමීම නිර්දේශ කර ඇත. ඒ අනුව, එකී ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ක්ෂේත්‍රවල හඳුනාගනු ලැබ ඇති ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම**

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, ලංකා සළුසල ලිමිටඩ්, ලංකා පිඟන් සංස්ථාව සහ අපනයන සංවර්ධන මණ්ඩලය සතුව පවතින කාර්යමණ්ඩලය, ස්වභාවික සම්පත්, යන්ත්‍රසූත්‍ර හා අනෙකුත් භෞතික සම්පත් යොදා ගනිමින් එම ආයතන/අංශ පවත්නා තත්ත්වයෙන් ඉහළට ඔසවා තැබීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය හා අනෙකුත් තීරණ අදාළ ආයතන/අංශ සහ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ක්‍රියාවට නංවනු ලබයි. ඒ අනුව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ආංශික සංවර්ධන වැඩසටහන යටතේ 2025 වර්ෂය වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 100ක් පහත සඳහන් ව්‍යාපෘති සඳහා වෙන් කිරීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් සංවිධාන කරනු ලබන Reality Show වැඩසටහන සඳහා.

* ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මඟින් සංවිධාන කරනු ලබන Industry Export ප්‍රදර්ශනය සඳහා.

* දේශීය රෙදිපිළි නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය සහන මිලට ලබා දීම සඳහා චක්‍රීය අරමුදලක් ඇති කිරීමේ ලංකා සළුසල ලිමිටඩ් නියමු ව්‍යාපෘතිය සඳහා.

* ලංකා පිහන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයට කාරක ප්‍රාග්ධනය සැපයීම සඳහා.

* කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පරිශ්‍රයේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන පරීක්ෂණ අංගනයට (Security Checkpoint at Cargo Village) Advanced Scanner Technology හඳුන්වා දීම පිණිස Scanner යන්ත්‍ර මිලදී ගැනීම සඳහා.

08. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ විකාශන කටයුතු වැඩිදියුණු කර පවත්වාගෙන යාම

මෙරට ප්‍රථම රූපවාහිනී නාලිකාව ලෙස ආරම්භ වූ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය 100%ක් කොටස් අයිතිය මහා භාණ්ඩාගාරය සතු සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. කෙසේ වුවද, වසර ගණනාවක් පැරණි පරිගණක උපාංග හා යල්පැනගිය මෘදුකාංග භාවිත කරමින් වැඩසටහන් නිෂ්පාදනය කිරීමට සිදු වීම හේතුවෙන් ක්ෂේත්‍රයේ තරගකාරීව කටයුතු කරමින් ගුණාත්මකබවින් ඉහළ, ආකර්ෂණීය වැඩසටහන් විකාශය කිරීම ගැටලු සහගත වී තිබේ. එබැවින්, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාවක් සැලකිල්ලට ගෙන, ප්‍රේක්ෂක ආකර්ෂණය ඉහළ නංවාගැනීමට සහ විකාශන කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකි වන පරිදි ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සඳහා අත්‍යවශ්‍ය උපකරණ කිහිපයක් සපයා ගැනීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමුඛතා පදනම මත 2026 අයවැය මඟින් වෙන් කර දීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

09. පළාත් පාලන ආයතනවල කසළ ප්‍රවාහන කටයුතු විධිමත් කිරීම සඳහා කසළ ප්‍රවාහන කම්පැක්ටර් රථ මිල දී ගැනීම

සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වර්තමානයේදී අභියෝග සහ දුෂ්කරතා රැසකට මුහුණ දෙමින් සිටී. ඒ අනුව, නාගරික කසළ කළමනාකරණය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. පරිසර හිතකාමීව එකතු කරනු ලබන නාගරික අපද්‍රව්‍ය මහජන පීඩා අවම වන පරිදි පිරියම් කරනු ලබන ස්ථාන කරා ප්‍රවාහනය කිරීම පිණිස දැනට පවතින කසළ ප්‍රවාහන කම්පැක්ටර් රථ සහ ට්‍රැක්ටර් රථ යොදා

ගනු ලබන අතර, ඒ සඳහා කම්පැක්ටර් රථ 100ක් දේශීය ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් මිල දී ගැනීමට 2017 වර්ෂයේදී කටයුතු කර ඇත. එහෙත්, දැනට ජනනය වන කසළ ප්‍රමාණය කළමනාකරණය කිරීම සඳහා එම රථ සංඛ්‍යාව සහ පළාත් පාලන ආයතන සතු ට්‍රැක්ටර් ඇතුළු වාහන සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ 2025 වර්ෂය වෙනුවෙන් වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 500ක ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් තෝරා ගත් පළාත් පාලන ආයතනවල කසළ එක්රැස් කිරීම සහ ප්‍රවාහනය විධිමත් කිරීම සඳහා කසළ ප්‍රවාහන කම්පැක්ටර් රථ 16ක් මිල දී ගැනීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවී සිටින තරුණ පුද්ගලයින් සඳහා වන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ නව නේවාසික ගොඩනැගිල්ලක් ඉදි කිරීම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වී සිටින පුද්ගලයින් සඳහා නේවාසික හා නේවාසික නොවන ප්‍රජා පාදක ආකෘතීන් යටතේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් මතුව ඇති ආබාධ සහිත අවුරුදු 21 ට වඩා අඩු ළමුන් සහ තරුණ පුද්ගලයින් සඳහා වෙන් වූ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් මාම්පිටිය වත්ත, හන්දෙස්ස, පේරාදෙණිය යන ස්ථානයේ පවත්වාගෙන යනු ලැබේ. එම වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින්ගේ මනෝ-සමාජීය ලක්ෂණ සහ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ඔවුන්ගේ චර්යාවන් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ප්‍රතිකාර කිරීමේදී අදාළ පුද්ගලයන් සඳහා වෙන් වූ ප්‍රතිකාර සේවාවන් හා වෙන් වූ ප්‍රමාණවත් ඉඩපහසුකම් අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත. දැනට අදාළ මධ්‍යස්ථානයේ නේවාසික ධාරිතාව පවතින්නේ පුද්ගලයින් 35 දෙනෙකුට පමණක් වන බැවින්, පොරොත්තු ලේඛන පවත්වාගෙන යමින් ඇතුළත් කර ගැනීම් කිරීමට සිදු ව තිබේ. එබැවින්, මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ ළමුන් සහ තරුණ පුද්ගලයින් සඳහා ප්‍රතිකාර අවස්ථාවන් පුළුල් හා කඩිනම් කිරීමට හැකි වන පරිදි ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 110ක් වැය කර පේරාදෙණිය ප්‍රතිකාර මධ්‍යස්ථාන පරිශ්‍රයේ නව නේවාසික ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිණිස මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය (SLIA) පනත සංශෝධනය කිරීම**

1996 අංක 14 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය (සංශෝධන) පනත මගින් සංශෝධිත 1976 අංක 1 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය පනතෙහි විධිවිධාන අනුව, වාස්තු විද්‍යා වෘත්තිය, එහි පරිචය සහ වාස්තු විද්‍යා අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකාවේ ස්ථාපිත එකම ආයතනය වන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය ස්ථාපිත කර ඇත. වෘත්තිය භාවිතයන්හි වර්තමාන සන්දර්භය සමඟ සාර්ථකව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය විසින් ප්‍රධාන පනතේ "වාස්තු විද්‍යාවෙහි පරිචය සහ සාමාජිකත්වය හා පදවි නාම භාවිතය" හා අදාළ වගන්ති සංශෝධනය කිරීමට යෝජනා කර තිබේ. ඒ අනුව, අදාළ කාර්යය සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස 2023-04-17 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. එකී අනුමැතිය පරිදි ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම පිණිස නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. මාතර සංස්කෘතික හා සංවර්ධන මණ්ඩලය ස්ථාපනය කිරීම සඳහා පනතක් සකස් කිරීම**

ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ආර්ථික හා රැකියා ප්‍රතිලාභ උදෙසා සංරක්ෂණය කර සංවර්ධනය කළ යුතු ඉතා වැදගත් ඓතිහාසික, සංස්කෘතික සහ ස්වභාවික සංචාරක විභවයක් සහිත නගරයක් වශයෙන් මාතර හඳුනාගනු ලැබ ඇත. එහෙත්, එම විභවයන් ඌන උපයෝජිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය වී තිබේ. එබැවින්, මාතර නගරය සංවර්ධනය කිරීම, එහි උරුමයන් තිරසර ලෙස සංරක්ෂණය කිරීම, නගරය නව්‍යකරණය කිරීම යන අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීම සඳහා මාතර උරුමය හා සංවර්ධනය සම්බන්ධ පනතක් සකස් කිරීම අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත. ඒ අනුව, මාතර නගරය සඳහා මාතර උරුමය සහ සංවර්ධනය සම්බන්ධ පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. 'මව්කිරි දීම ප්‍රවර්ධනය කිරීම' පිළිබඳ පනත් කෙටුම්පත සකස් කිරීම

මව්කිරි දීමේ දර්ශක සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළම තලයක පවතින අතර, World Breastfeeding Trends initiative (WBTi) විසින් 'Green Status' ලබා දුන් ප්‍රථම රට බවට ශ්‍රී ලංකාව පත් ව ඇත. වාණිජමය පරමාර්ථ මුල් කර ගෙන කිරිපිටි කර්මාන්තය මඟින් දරුවන් වෙත එල්ල වන සදාචාර විරෝධී සහ හානිකර බලපෑම්වලින් දරුවන් ආරක්ෂා කරමින් දරුවන්ගේ සෞඛ්‍ය සහ පෝෂණය ආරක්ෂා කිරීමත්, විද්‍යාත්මකව තහවුරුව ඇති ප්‍රධානතම මැදිහත් වීමක් ලෙස සලකා මව්කිරි දීම ආරක්ෂා කිරීමත්, මව්කිරි දීම සම්බන්ධයෙන් ගෝලීය ප්‍රමුඛයා ලෙස මෙරටට ඇති පිළිගැනීම අඛණ්ඩව පවත්වා ගැනීම සහතික කිරීමත් අරමුණු කරගෙන මව්කිරි දීම ප්‍රවර්ධනය කිරීම සඳහා පනතක් මඟින් නීතිමය විධිවිධාන හඳුන්වා දීම පිණිස 2018-10-16 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, අදාළ පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත (ශාරීරික දඬුවම්) සඳහා සංශෝධන

ඕනෑම ක්ෂේත්‍රයක ශාරීරික දඬුවම් මඟින් හිංසනයට ලක් කිරීම තහනම් කිරීම සඳහා විධිවිධාන පැනවීම පිණිස 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා 2024-04-29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අදාළ කාර්යය සඳහා සංශෝධන පනත් කෙටුම්පතක් සකස් කිරීම සම්බන්ධයෙන් වර්තමාන අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය (ශාරීරික දඬුවම්) සංශෝධනය කිරීම සඳහා පනත

ශාරීරික දඬුවම් මඟින් දරුවෙකුට සිදු වන ශාරීරික හා මානසික හිංසනය පුළුල් බව විද්‍යාත්මකව ඔප්පු කර තිබේ. එබැවින්, ඕනෑම ක්ෂේත්‍රයක ශාරීරික දඬුවම් මඟින් හිංසනයට ලක් කිරීම තහනම් කිරීම සඳහා සහ ශාරීරික හිංසනය වෙනුවෙන් දඬුවම් නියම කිරීම සඳහා විධිවිධාන පැනවීම පිණිස (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම පිණිස 2024-04-29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අදාළ කාර්යය සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස මීට පෙර

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති නමුත් ඒ අනුව කටයුතු කිරීමට හැකි වී නොමැත. එම පනත් කෙටුම්පත කඩිනමින් නීතිගත කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, එම පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********